*සැ. යු.-* 2013.01.18 දින පළ වූ අංක 1,794 දරන *ගැසට් පත්‍රයේ* III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,795 - 2013 ජනවාරි මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2013.01.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 312 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 පෙබරවාරි මස 15 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 පෙබරවාරි මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
*රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

311 - B 80686 — 7,100 (2013/01)
F1-

# පළාත් සභා නිවේදන

## මධ්‍යම පළාතේ ගරු ආණ්ඩුකාරවරයාගේ දැන්වීම

මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවර ටිකිරි කොබ්බෑකඩුව වන මම, 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ආ) ව්‍යවස්ථාවේ 8 (ආ) ඡේදය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව දෙදහස් දොළහ වර්ෂයේ දෙසැම්බර් මස 06 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි මධ්‍යම පළාත් සභාවේ - පස්වන සභාවේ හතරවන සැසිවාරය අවසන් කරනු ලබන බැව් මෙයින් දැනගත යුතුයි.

එකී ව්‍යවස්ථාවේ 08 (අ) ඡේදය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව යථෝක්ත සභාව වර්ෂ දෙදහස් දහතුනක් වූ පෙබරවාරි මස 01 වැනි කිව් දින පෙරවරු 10.00 ට, පල්ලේකැලේ, කුණ්ඩසාලේ පිහිටි මධ්‍යම පළාත් සභාවේ රැස්වීම් ශාලාවේ දී නැවත රැස්වන පරිදි කැඳවන බව මෙයින් දැනගත යුතු ය.

ටිකිරි කොබ්බෑකඩුව,
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර.

වර්ෂ දෙදහස් දොළහක් වූ දෙසැම්බර් මස 05 වැනි දින,
මහනුවර දී අත්සන් කරන ලදී.

01-769

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.